BOI
SRI LANKA

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

**භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ විකිණීම සඳහා මිල ගණන් කැඳවීම - BOI/ADMN/Q/083/2026**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ ගබඩා කර ඇති භාවිතයෙන් ඉවත් කළ පහත සඳහන් වර්ග වලට අයත් භාණ්ඩ කාණ්ඩ (Lot) වශයෙන් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| කාණ්ඩ අංකය | වර්ගය | විස්තරය |
|---|---|---|
| (1) | කාර්යාලයීය ගෘහ භාණ්ඩ | පුටු (Visitors Chair, Low back chairs, Medium back chairs, High back chairs, Typing chairs, Conference chairs, Plastic chairs) හා කාර්යාලීය මේස (Executive table, Reception table, Clerical table, Computer table, Dining table) කබඩ් (ලී සහ වානේ), Lobby Seat, MDF board, Plywood Boards, කැබිනට් හා රාක්ක , Chest of Drawers |
| (2) | විදුලි උපාංග | Television, Refrigerator, Water pump & accessories, AC, Monitor, UPS, Printer, Keyboards, CPU, Fax Machine, Photocopy machine |
| (3) | වෙනත් | වීදුරු ජනේල සහිත ඇලුමිනියම් දොරවල්, Bulbs, Tyres (used) , water boiler, Cushion, Water pump , Panel boards, Control panel, Tube lights |

ඉහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීම කාර්යාල දිනයන්හීදී **පෙ.ව. 09.00 සිට ප.ව.03.30 අතර කාලය තුල 2026/07/06 දින සිට 2026/07/20 දින දක්වා** සහ ඊට පසු දින එනම් **2026/07/21** දින **ප.ව. 12:00** දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ බොස්ටල් ගොඩනැගිල්ලේ සිදුකල හැක. වැඩි විස්තර නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) දුරකථන අංක 011-2427190, පරිපාලන නිලධාරී දුරකථන අංක 071-4398260, කලමනාකරණ සහකාර දුරකථන අංක 076-1938880 ඇමතීමෙන් ලබා ගත හැක.

මිල ගණන් ඉදිරිපත් කිරීමේ පත්‍රිකාව වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ කලාප කලමනාකරණ ඒකකය වෙතින් **2026/07/06 දින සිට 2026/07/21 දින ප.ව. 12:30 දක්වා** ලබාගත හැක. මේ සඳහා නැවත නොගෙවන රු. 1000/- + (VAT) ගාස්තුවක් ගෙවිය යුතු අතර මිල ගණන් ඉදිරිපත් කිරීමේ පත්‍රිකාව සමග රු.16,000/- නැවත ගෙවනු ලබන මුදල් ඇපකරයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ගෙවිය යුතුය. සියලුම මුදල් ගෙවීම් **පෙ.ව. 09.00 සිට ප.ව.03.00 අතර කාලය තුල 2026/07/06 දින සිට 2026/07/20 දින දක්වා** සහ ඊට පසු දින එනම් **2026/07/21 දින ප.ව. 12.30** දක්වා පමනක් වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ මුදල් අංශය වෙත සිදු කල යුතුය.

භාණ්ඩ වෙන්කර ඇති කාණ්ඩය (Lot) සඳහා පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර කාණ්ඩයක (Lot) කොටසකට හෝ එක් එක් අයිතම සඳහා ඉදිරිපත් කරන මිල ගණන් සළකා බලනු නොලැබේ.

මුද්‍රා තබන ලද සියලු විස්තර ඇතුළත් මිල ගණන් එදිනම එනම් **2026/07/21** දින **ප.ව. 02:00**ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, කලාප කලමනාකරණ ඒකකය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, වතුපිටිවල අපනයන සැකසුම් කලාපය, වතුපිටිවල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කළ යුතුය. එදිනම **ප.ව. 02:00**ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර මිල ගණන් ඉදිරිපත් කරන අයට හෝ ඔහුගේ නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැක.

අදාල ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ විකිණීම සඳහා මිල ගණන් කැඳවීම** -2026 (BOI/ADMN/Q/083/2026)" යනුවෙන් සඳහන් කළයුතු වේ.

ඉදිරිපත් කරන මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

සභාපති
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**